ADG. Menaka Munasinghe
By Hon HCJ. P. Ranasinghe
conviction.

<u>කොළඹ මහාධිකරණය - අංක 07 දීය.</u>

<u>කොළඹ මහාධිකරණ විනිසුරු පියසේන රණසිංහ මැතිතුමා ඉදිරිපිටදීය.</u>

සටහන් කළේ : ල/ලේ. ප්‍රබෝධනි විසිනි.

<u>නඩු අංකය :- HCB 1907/12</u>

<u>දිනය:- 2017.06.28.</u>

<u>තීන්දුව.</u>

මෙම නඩුවේ විත්තිකරුට විරුද්ධව වර්ෂ 2008 ක්වූ දෙසැම්බර් මස 20 වන දින සිට 2009 ක්වූ පෙබරවාරි මස 03 දින අතර කාලය තුලදී, මෙම අධිකරණ බල සීමාව තුල පිහිටි පුත්තලමේදී රජයේ සේවකයෙකු එනම්, බස්නාහිර පළාත් බුද්ධි කොට්ඨාශයේ හලාවත ඒකකයේ ස්ථානාධිපති උප පොලිස් පරීක්ෂක ලෙස සේවයේ යෙදී සිටි යුෂ්මතා අතුරුදහන් වූ වික්ටර් ස්ටැන්සි ප්‍රැන්සිස් යන අය සොයා ගැනීම සඳහා ආධාර කිරීම පිණිස පෙළඹවීමක් හෝ ත්‍යාගයක් වශයෙන් රුපියල් 350,000/- ක්වූ මුදලක තුටු පඩුරක් දනන්සූරිය අප්පුහාමිලාගේ අශෝකා දනන්සූරිය යන අයගෙන් අයැදීමෙන් අල්ලස් පනතේ 16(ආ) වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් කළ බවත්,

ඉහත 01 වන චෝදනාවේ සඳහන් වේලාවේදී ස්ථානයේදී හා එකී ක්‍රියාවලියේදීම රජයේ සේවකයෙකු එනම්, බස්නාහිර පළාත් බුද්ධි කොට්ඨාශයේ හලාවත ඒකකයේ ස්ථානාධිපති උප පොලිස් පරීක්ෂක ලෙස සේවයේ යෙදී සිටි යුෂ්මතා රුපියල් 350,000/- ක්වූ මුදලක තුටු පඩුරක් දනන්සූරිය අප්පුහාමිලාගේ අශෝකා දනන්සූරිය යන අයගෙන් අයැදීමෙන් අල්ලස් පනතේ 19(ඇ) වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් කළ බවත්,

වර්ෂ 2009 ක්වූ පෙබරවාරි මස 03 දින හෝ ඊට ආසන්න දිනයකදී ඉහත 01 වන චෝදනාවේ සඳහන් ස්ථානයේදී හා එකී ක්‍රියාවලියේදීම රජයේ සේවකයෙකු එනම්, බස්නාහිර පළාත් බුද්ධි කොට්ඨාශයේ හලාවත ඒකකයේ ස්ථානාධිපති උප පොලිස් පරීක්ෂක ලෙස සේවයේ යෙදී සිටි යුෂ්මතා අතුරුදහන් වූ වික්ටර් ස්ටැන්සි

ප්‍රැන්සිස් යන අය සොයා ගැනීම සඳහා ආධාර කිරීම පිණිස පෙළඹවීමක් හෝ ත්‍යාගයක් වශයෙන් රුපියල් 350,000/- ක්වූ මුදලක තුටු පඩුරක් දනන්සූරිය අප්පුහාමිලාගේ අශෝකා දනන්සූරිය යන අයගෙන් අයැදීමෙන් අල්ලස් පනතේ 16(ආ) වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් කළ බවත්,

ඉහත 03 වන චෝදනාවේ සඳහන් වේලාවේදී ස්ථානයේදී හා එකී ක්‍රියාවලියේදීම රජයේ සේවකයෙකු එනම්, බස්නාහිර පළාත් බුද්ධි කොට්ඨාශයේ හලාවත ඒකකයේ ස්ථානාධිපති, උප පොලිස් පරීක්ෂක ලෙස සේවයේ යෙදී සිටි යුෂ්මතා, රුපියල් 350,000/- ක්වූ මුදලක තුටු පඩුරක් දනන්සූරිය අප්පුහාමිලාගේ අශෝකා දනන්සූරිය යන අයගෙන් භාරගැනීමෙන් අල්ලස් පනතේ සංශෝධිත 19(ඇ) වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් කළ බවත්,

වර්ෂ 2009 ක්වූ අප්‍රේල් මස 23 දින හෝ ඊට ආසන්න දිනයකදී ඉහත 01 වන චෝදනාවේ සඳහන් ස්ථානයේදී, හා එකී ක්‍රියාවලියේදීම රජයේ සේවකයෙකු එනම්, බස්නාහිර පළාත් බුද්ධි කොට්ඨාශයේ හලාවත ඒකකයේ ස්ථානාධිපති උප පොලිස් පරීක්ෂක ලෙස සේවයේ යෙදී සිටි යුෂ්මතා අතුරුදහන් වූ වික්ටර් ස්ටැන්සි ප්‍රැන්සිස් යන අය සොයා ගැනීම සඳහා ආධාර කිරීම පිණිස පෙළඹවීමක් හෝ ත්‍යාගයක් වශයෙන් රුපියල් 150,000/- ක්වූ මුදලක තුටු පඩුරක් දනන්සූරිය අප්පුහාමිලාගේ අශෝකා දනන්සූරිය යන අයගෙන් අයැදීමෙන් අල්ලස් පනතේ 16(ආ) වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් කළ බවත්,

ඉහත 05 වන චෝදනාවේ සඳහන් වේලාවේදී ස්ථානයේදී හා එකී ක්‍රියාවලියේදීම රජයේ සේවකයෙකු එනම්, බස්නාහිර පළාත් බුද්ධි කොට්ඨාශයේ හලාවත ඒකකයේ ස්ථානාධිපති, උප පොලිස් පරීක්ෂක ලෙස සේවයේ යෙදී සිටි යුෂ්මතා, රුපියල් 150,000/- ක්වූ මුදලක තුටු පඩුරක් දනන්සූරිය අප්පුහාමිලාගේ අශෝකා දනන්සූරිය යන අයගෙන් අයැදීමෙන් අල්ලස් පනතේ සංශෝධිත 19(ඇ) වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් කළ බවත්,

වර්ෂ 2009 ක්වූ මැයි මස 06 දින හෝ ඊට ආසන්න දිනයකදී ඉහත 05 වන චෝදනාවේ සඳහන් ස්ථානයේදී, හා එකී ක්‍රියාවලියේදීම රජයේ සේවකයෙකු එනම්, බස්නාහිර පළාත් බුද්ධි කොට්ඨාශයේ හලාවත ඒකකයේ ස්ථානාධිපති, උප පොලිස් පරීක්ෂක ලෙස සේවයේ යෙදී සිටි යුෂ්මතා රුපියල් 150,000/- ක්වූ මුදලක තුටු පඩුරක් දනන්සූරිය අප්පුහාමිලාගේ අශෝකා දනන්සූරිය යන අයගෙන් භාරගැනීමෙන් අල්ලස් පනතේ 16(ආ) වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් කළ බවත්,

ඉහත 07 වන චෝදනාවේ සඳහන් වේලාවේදී ස්ථානයේදී හා එකී ක්‍රියාවලියේදීම රජයේ සේවකයෙකු එනම්, බස්නාහිර පළාත් බුද්ධි කොට්ඨාශයේ හලාවත ඒකකයේ ස්ථානාධිපති, උප පොලිස් පරීක්ෂක ලෙස සේවයේ යෙදී සිටි යුෂ්මතා, රුපියල් 150,000/- ක්වූ මුදලක තුටු පඩුරක් දනන්සූරිය අප්පුහාමිලාගේ අශෝකා දනන්සූරිය යන අයගෙන් භාරගැනීමෙන් අල්ලස් පනතේ සංශෝධිත 19(ඇ) වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් කළ බවටත් චෝදනා කරමින් මෙම නඩුව පවරා ඇත.

පැමිණිල්ල විසින් විත්තිකරුට විරුද්ධව නගා ඇති චෝදනා ඔප්පු කිරිම සඳහා සාක්ෂිකරුවන් වන අශෝකා දනන්සූරිය, බලයලත් විමර්ශන නිලධාරි ප්‍රදීප් චමින්ද කුමාර, ප්‍රධාන පොලිස් පරීක්ෂක අනිල් ප්‍රියන්ත ලියනගේ, පොලිස් පරීක්ෂක ප්‍රියන්ත රෝහණ අධිකාරි, පොලිස් පරීක්ෂක නිමල් ධර්මසූරිය රාජපක්ෂ, ශාමලි ලක්නිකා ප්‍රනාන්දු, පොලිස් කොස්තාපල් 41344 රණතුංග ආරච්චිගේ ජයසිංහ කැඳවා ඇත.

මෙම සාක්ෂිකරුවන් සාක්ෂි දීමෙන් අනතුරුව පැමිණිල්ල විසින් පැමිණිල්ලේ නඩුව අවසන් කර ඇති අතර, විත්තිය කැඳ වූ පසුව විත්තිකරු කූඩුවේ සිට ප්‍රකාශයක් කොට විත්තියේ නඩුවද අවසන් කොට ඇත.

මෙම නඩුවේ විත්තකරු රජයේ සේවකයෙකු බවත්, මෙම නඩුවේ චෝදනාවලට අදාල කාලයේදී උප පොලිස් පරීක්ෂකවරයෙකු වශයෙන් හලාවත බුද්ධි ඒකකයේ

ස්ථානාධිපති ලෙස සේවය කළ බවත්, ඔහුට රාජකාරි කටයුතු සිදු කිරිමේදී මහජනතාවගෙන් යම් තුටු පඩුරක් ලබා ගැනීමට නීත්‍යානුකූල හිමිකමක් නැති බවත් පිළිගෙන ඇත.

පැමිණිලිකාරිය වන අශෝකා දනන්සූරිය සාක්ෂි දෙමින් පවසා ඇත්තේ, ඇය හෙට්ටිගේ වික්ටර් ස්ටැන්සි ප්‍රැන්සිස් නැමැති පුද්ගලයා සමඟ අවුරුදු 27ක පමණ කාලයක් අඹුසැමියන් වශයෙන් බත්තුළුඔය ප්‍රදේශයේ පදිංචිව ජීවත් වූ බවය. 2008.11.16 වන දින රාත්‍රී 7.20ට පමණ මුන්දලම පොලිසියෙන් බව පවසමින් පුද්ගලයින් හතර දෙනෙකු නිවසට පැමිණි බවත්, එක් අයෙකු නිල ඇඳුමට සමාන ඇඳුමක් ඇඳ සිටි බවත්, අනික් අයවලුන් සිවිල් ඇඳුමින් සැරසී සිටි බවත් පවසා ඇත. ඔවුන් පැමිණ හැඳුනුම්පත් පරික්ෂා කිරිමට අවශ්‍ය බව කියා පැවසූ බවත්, ඇයගේ ස්වාමි පුරුෂයා ඔහුගේ හැඳුනුම්පත රැගෙන ගිය විට එය පරණයි කියා කතා කර කර සිටිද්දී ඔවුන් මෙම සාක්ෂිකාරියගෙන් වතුර ඉල්ලා ඇත. ඇය වතුර ගෙන ඒම සඳහා ගෙට ගිය විට එම පැමිණි අයවලුන් ඇයගේ පුරුෂයාව ඔවුන් රැගෙන ගොස් ඇති බව දැනගත් බවත්, ඉන් පසුව මුන්දලම පොලිසියට ගොස් ඒ පිළිබඳව ස්ථානාධිපතිවරයා හමු වී විමසූ විට ඇයගේ පුරුෂයා එම පොලිස් ස්ථානයට රැගෙන ආවේ නැති බව පැවසූ විට ඒ සම්බන්ධයෙන් මුන්දලම පොලිසියට පැමිණිල්ලක් කරන ලද බවත් සාක්ෂි දෙමින් පවසා ඇත. පසුව මෙම සාක්ෂිකාරිය ඇයගේ පුරුෂයාව පැහැර ගෙන යාම සම්බන්ධයෙන් රජයේ ආයතන කිහිපයකටම ගොස් සොයා බලා ඇති නමුත් ඔහු පිළිබඳව කිසිදු තොරතුරක් දැන ගන්නට ලැබී නැත.

මෙම සාක්ෂිකාරියට අනුව ඇය ඉන් පසුව හලාවත පොලිස් අධිකාරිවරයාට ඒ පිළිබඳව දැනුම් දීම සඳහා ඔහුගේ කාර්යාලයට ගොස් ඇති අතර, එම කාර්යාලයට පැමිණ සිටි අයවලුන්ගේ කීම පරිදි මෙම නඩුවේ විත්තිකරුව මුණ ගැසී ඇති අතර, විත්තිකරු ඇයට දොස් පවරා එදින ඔහුගේ කාර්යාලයෙන් ඇයව යවා ඇත. මෙම සාක්ෂිකාරිය ඉන් පසු අවස්ථා දෙක තුනකදී පොලිස් අධිකාරි කාර්යාලයේදී මෙම විත්තිකරුව හමු වී ඇති අතර, ඇය ඇයගේ ස්වාමි පුරුෂයාගේ අතුරුදහන් වීම පිළිබඳව ඔහුට පවසා ඇත. ඔහුගේ අතුරුදහන් වීම පිළිබඳව සොයා බැලීමට

විත්තිකරු එකඟ වූ බවත්, ගෙදරට ඇවිත් විස්තර කියන්නම් කියා පැවසූ බවත් ඇයගේ සාක්ෂිය විය. මෙම සාක්ෂිකාරියට අනුව විත්තිකරු ඇයගේ නිවසට පැමිණ ඇති අතර, මාස තුනක් ඇතුළත ඇයගේ නැති වූ පුරුෂයා ගෙදරටම ගෙනැත් දෙන බව පවසා ඒ සඳහා ලක්ෂ තුනහමාරක් ලබා දෙන ලෙස ඉල්ලා ඇත. ඉන් පසු ඇය, ඇයට අයත් රත්රන් බඩු මුන්දලම ග්‍රාමීය බැංකුවට උකස් තබා ලබා ගත් මුදල්ද පොතේ තිබුණු සල්ලිද සමගින් ලක්ෂ තුනහමාරක් සූදානම් කර ගෙන එම මුදල් සූදානම් බවත්, එම මුදල් රැගෙන යන ලෙසට විත්තිකරුගේ ජංගම දූරකථනයට කතා කොට දැනුම් දුන් බවත්, ඒ අනුව 2009.02.03 වන දින මෙම නඩුවේ විත්තිකරු නිවසේ ගේට්ටුව අසලට පැමිණි අවස්ථාවේදී එම ස්ථානයේදී ඔහුට මුදල් ලබා දුන් බවත් සාක්ෂි දෙමින් පවසා ඇත. රන් භාණ්ඩ උකස් තබන ලද බව සනාථ කිරීම සඳහා අදාල උකස් පත්‍රිකා පැ.1, පැ.2, සහ පැ.3 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කොට ඇති අතර, එම රන් භාණ්ඩ උකස් තැබීම සම්බන්ධයෙන් නිකුත් කරන ලද රිසිට්පත්වල සඳහන් දිනයේදී පැමිණිලිකාරිය විසින් ප්‍රාදේශීය සංවර්ධන බැංකුව මුන්දලම ශාඛාවට එම භාණ්ඩ උකස් තබන ලද බව එම ශාඛාවේ බැංකු කළමනාකාරිනි ශාලිමා ලක්මිණි ප්‍රනාන්දු විසින් දෙන ලද සාක්ෂියෙන් තහවුරු කොට ඇත. එම උකස් පත්‍රිකාවලට අනුව රුපියල් දෙලක්ෂ පන්දාහක මුදලක් ඇය ණයට ලබා ගෙන ඇත. ඉතිරි මුදල බැංකු පොතෙන් ලබා ගෙන රුපියල් 350,000/-ක් පෙබරවාරි මස 3 වන දින සවස ඇයගේ නිවසේ ගේට්ටුව අසලදී විත්තිකරු ලබා ගත් බව ඇයගේ සාක්ෂිය විය.

මෙම මුදල විත්තිකරු ලබා ගත්තේ, ඇයගේ පුරුෂයාව සොයා දීමේ පොරොන්දුව මත බවත්, මාස තුනකින් පසුව විත්තිකරු, දෙන ලද මුදල් ඉවර වූ බව පවසා තවත් එක් ලක්ෂ පනස්දාහක් අවශ්‍ය බව ඇයට දූරකථනයෙන් කියා සිටි බවත්, එම මුදල ඉල්ලා සිටියේ මැයි මාසයේ බවත් සාක්ෂි දෙමින් පවසා ඇත. මෙම විත්තිකරු බොරු කරන බව තේරුම් ගිය නිසා අල්ලස් කොමිසමට පැමිණිල්ලක් කළ බවත් පවසා ඇත. එම පැමිණිල්ල කළ දිනට පසු දින එනම්, 2009.05.06 වන දින අල්ලස් කොමිසමේ නිලධාරීන් පැමිණිලිකාරියගේ නිවසට පැමිණ ඇත. පැමිණිලිකාරිය කණ්ඩායම් භාර නිලධාරියාගේ උපදෙස් මත විත්තිකරුට දූරකථන

ඇමතුමක් ලබා දී රුපියල් ලක්ෂ එකහමාර සූදානම් බවත්, එය පැමිණ රැගෙන යන ලෙසට කියා සිටි බවත් පවසා ඇත. එවිට විත්තිකරු නීතිපතිතුමාගේ වැඩ වගයක් තිබෙන නිසා පැමිණීමට හැකියාවක් නැති බවත්, පෝස්ට් ඔෆිස් එක ගාවට ගෙනැත් දෙන්න කියා පැවසූ බවත් ඇයගේ සාක්ෂියබ විය.

මෙම සාක්ෂිකාරියට අනුව මුලින් ලබා දුන් ලක්ෂ තුනහමාරට මොනවද කළේ කියා විත්තිකරුගෙන් දුරකථනයෙන් විමසා ඇත. ඊට පිළිතුරු වශයෙන් පොලිසියේ උසස් නිලධාරින්ට මාළු, කරවල ගෙනිහින් දුන්නා හෝටල්වල කාමර අරගෙන දුන්නා ඒවට ලක්ෂ තුනහමාර ඉවර වුනා කියා විත්තිකරු ඇයට පැවසූ බව සාක්ෂි දෙමින් කියා ඇත. සාක්ෂිකාරියට අනුව ඇය විත්තිකරුට දුරකථන ඇමතුම ඇයගේ කාමරයේ ඇති ස්ථාවර දුරකථනයෙන් ලබා ගෙන ඇති අතර, එම දුරකථන සංවාදවලට නිවසේ සාලයේ තිබූ දිගුවෙන් පොලිස් පරීක්ෂක ලියනගේද සවන් දී ඇත. දුරකථන සංවාදවලින් පසුව විත්තිකරු දන්වා සිටි අන්දමට පැමිණිලිකාරිය සහ විමර්ශන නිලධාරින් හලාවත නගරයට ගොස් ඇත. එසේ යාමට පෙර පොලිස් පරීක්ෂක ප්‍රියන්ත ලියනගේ රුපියල් ලක්ෂ එකහමාරක මුදලක් සිලි සිලි බෑගයකට දමා පැමිණිලිකාරියට දී ඇති අතර, ඇය එම මුදල ඇයගේ අත් බෑගයේ රැගෙන ගොස් ඇත. එම මුදල් නෝට්ටුවල අංක විමර්ශන නිලධාරියා ඔහුගේ සටහන් පොතේ ලියා තිබූ අංක සමඟ සැසඳෙන්නේද යන්න ඇය විසින් පරීක්ෂා කරන ලද බවත් පවසා ඇත. එම මුදල් දා තිබූ ෂොපින් බෑගය පැ.4 වශයෙන් ලකුණු කොට ඇත.

මෙම පැමිණිලිකාරිය මෙම නඩුවට අදාල වැටලීමට උපාය දූතයා වශයෙන් සහභාගි වී ඇති අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ විමර්ශන නිලධාරි චමින්ද කුමාර සමඟ හලාවත තැපැල් කාර්යාලය තුළට ගොස් ඇත. එහි ගොස් තැපැල් කාර්යාලයේ දුරකථනයෙන් විත්තිකරුට ඇමතුමක් දි ඇය පෝස්ට් ඔෆිස් එකට පැමිණ සිටින බව ඔහුට දැනුම් දී එම කන්තෝරුවේ තිබූ පුටුවක ඉඳගත් බවත් අනෙක් පුටුව හිස්ව තබා ඊළඟ පුටුවේ විමර්ශන නිලධාරි චමින්ද වාඩි වූ බවත් පවසා ඇත. එම අවස්ථාවේදි විත්තිකරු එම ස්ථානයට පැමිණ ඔවුන් දෙදෙනා අතර

තිබූ හිස් පුටුවේ වාඩි වූ බවත්, ඒ අවස්ථාවේදී බොහොම අමාරුවෙන් මේ සල්ලි හොයා ගත්තේ කියා ලක්ෂ එකහාමාරක මුදල විත්තිකරුට ලබා දී ඇත. මුදල් ලබා ගැනීමෙන් පසුව ඔයාගේ මහත්තයා හොයලා දෙන්නම් සල්ලි සතයක්වත් නිරපරාදේ නාස්ති කරන්නේ නැහැ කියා විත්තිකරු පැවසූ බවත්, ඉන් පසුව ඇය එම ස්ථානයෙන් ඉවත්ව එළියට ගිය බවත් පවසා ඇත. ඉන් පසුව නිලධාරින් පැමිණ මෙම විත්තිකරුව අල්ලා ගෙන මාංචු දා ගෙන රැගෙන ආ බවත්, මුදල් ලබා දීම සම්බන්ධයෙන් වැටලීමෙන් පසුව විමර්ශන නිලධාරින්ට ප්‍රකාශයක් කරන ලද බවත් පවසා ඇත.

මෙම සාක්ෂිකාරිය විසින් 2008.11.16 වන දින පැය 19.50ට මුන්දලම පොලිස් ස්ථානයට ඇයගේ ස්වාමි පුරුෂයා වන ඩෙන්සිගේ වික්ටර් ස්ටැන්සි ප්‍රැන්සිස්ගේ අතුරුදහන් වීම සම්බන්ධයෙන් පැමිණිල්ලක් කරන ලද බව, එවකට එම පොලිසියේ ස්ථානාධිපති ධර්මසිරි රාජපක්ෂ සාක්ෂි දෙමින් තහවුරු කර ඇති අතර, අදාල පැමිණිල්ල පැ.6 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කර ඇත. මෙම වැටලීම සිදු කරන ලද 2009.05.06 වන දින පොලිස් පරීක්ෂක ලියනගේ ගේ උපදෙස් මත මෙම සාක්ෂිකාරිය විත්තිකරුගේ ජංගම දුරකථනයට ඇමතුමක් ලබා ගෙන ඇති අතර, එම ඇමතුමට පිළිතුරු දි ඇති තැනැත්තා පැමිණිලිකාරියට ඔයා ඉස්සෙල්ලා දුන්න රුපියල් 350,000/- කොළඹ ගිහින් ඒගොල්ලන්ට හොඳට සැලකුවා වශයෙන් පැවසූ බවට සාක්ෂි දෙමින් පවසා ඇත. එදින පැමිණිලිකාරිය ඇයගේ නිවසේදී විමර්ශන නිලධාරින්ගේ උපදෙස් මත විත්තිකරුට දුරකථනයෙන් කතා කරන ලද බව සාක්ෂි මත තහවුරුව ඇත. විත්තිකරුගේ ඉල්ලීම මත හලාවත තැපැල් කාර්යාලයේදි හමු වීමද සිදුව ඇත. එදින පැමිණිලිකාරිය විත්තිකරුට දුරකථන ඇමතුමක් ලබා දුන් බව විත්තිකරු විත්ති කූඩුවේ සිට පිළිගෙන ඇත.

මෙම නඩුවේ පැමිණිලිකාරිය විසින් දෙන ලද සාක්ෂිය දීර්ඝ වශයෙන් විත්තියේ හරස් ප්‍රශ්නවලට භාජනය වී ඇති නමුත් ඇය විසින් මෙම අධිකරණයේ දී ඇති සාක්ෂියෙහි කිසිදු පරස්පර විරෝධිතාවයක් දක්නට නොමැත. මෙම අධිකරණයේදී ඇය ඒකාකාරි සාක්ෂියක් ලබා දී ඇති අතර, ඇයගේ සාක්ෂිය

ප්‍රතික්ෂේප කිරීමට ප්‍රමාණවත් මෙම නඩුවේ මූලයට බලපාන කිසිදු පරස්පරවිරෝධීතාවයක්ද දක්නට නැත. මෙම නඩුවේ විත්තිකරු රුපියල් 150,000/- ක මුදලක් පැමිණිලිකාරියගෙන් අයැදීම සහ ලබා ගැනීම සම්බන්ධයෙන් ඇය විසින් දෙන ලද සාක්ෂිය උපාය දූතයා වශයෙන් සහභාගි වී ඇති බලයලත් විමර්ශන නිලධාරි චමින්ද කුමාරගේ සහ ප්‍රධාන පොලිස් පරීක්ෂක ප්‍රියන්ත ලියනගේ යන සාක්ෂිකරුවන්ගේ සාක්ෂිවලින් අනුසන්දනය වී ඇති බවද සඳහන්කළ යුතුය.

මෙම සාක්ෂිකාරියට විත්තිකරුට විරුද්ධව අසත්‍ය චෝදනාවක් එල්ල කිරීමට හෝ අසත්‍ය පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමට කිසිදු හේතුවක් තිබූ බවක් ඇයගේ සාක්ෂියෙන් හෝ අනිකුත් සාක්ෂි මඟින් අනාවරණය වන්නේද නැත. ඒ අනුව මෙම පැමිණිලිකාරිය විසින් මෙම අධිකරණයේ දී ඇති සාක්ෂිය අනුව ඇය මෙම අධිකරණයට පිළිගත හැකි විශ්වසනීය සාක්ෂිකාරියක වන බව මෙම අධිකරණයේ නිගමනය වන්නේය.

මෙම නඩුවට අදාල වැටලීම සඳහා උපාය දූතයා වශයෙන් සහභාගි වී ඇත්තේ බලයලත් විමර්ශන නිලධාරි චමින්ද කුමාර නැමැති අයය. මෙම වැටලීම සිදු කළ 2009.05.06 වන දින බත්තුළුඔය ප්‍රදේශයේ පිහිටි පැමිණිලිකාරියගේ නිවසට ප්‍රධාන පොලිස් පරීක්ෂක ලියනගේ ඇතුළු කණ්ඩායමක් සමඟ උදෑසන 10.15ට 10.30ට පමණ ගොස් ඇත. එම නිවසට ගොස් පැමිණිලිකාරිය මෙම වැටලීමට සහාය වන බවට එකඟතාවය පළ කිරීමෙන් අනතුරුව මෙම වැටලීම සංවිධානය කොට ඇත. විත්තිකරු විසින් ඉල්ලා ඇති මුදල සූදානම් බවත්, එය ලබා ගැනීමට පැමිණෙන ලෙස දුරකථනයෙන් විත්තිකරුට දැනුම් දෙන ලෙස පැමිණිලිකාරියට උපදෙස් දුන් බව මෙම සාක්ෂිකරු සාක්ෂි දෙමින් පවසා ඇත. ඉන් පසුව ඇය විත්තිකරුට කාමරයේ ඇති දුරකථනයෙන් කතා කොට ඇති අතර, එම දුරකථනයට සම්බන්ධ කර තිබූ සාලයේ තිබුණු දුරකථනයෙන් ප්‍රධාන පොලිස් පරීක්ෂක ලියනගේ එම සංවාදයට සවන් දුන් බවත්, පසුව විත්තිකරු අදාල මුදල රැගෙන හලාවත තැපැල් කාර්යාලය ළඟට එන්න කියා සිටි බැවින් අදාල මුදල වන රුපියල්

150,000/- පැ.4 වශයෙන් ලකුණු කොට ඇති කියන ෂොපින් බෑගය තුළට දමා පැමිණිලිකාරියට ලබා දුන් බවත් ඔහු සාක්ෂි දෙමින් පවසා ඇත.

ඉන් අනතුරුව මෙම නඩුවේ පැමිණිලිකාරිය සහ විමර්ශන නිලධාරින් හලාවතට පිටත්ව ගොස් ඇත. හලාවත ටෙලිකොම් ආයතනය ආසන්නයේ වෑන් රථය නතර කොට ඇති අතර, මෙම සාක්ෂිකරු පැමිණිලිකාරිය සමඟ හලාවත තැපැල් කාර්යාලය තුළට ගොස් ඇත. තැපැල් කාර්යාලයට යෑමෙන් පසු පැමිණිලිකාරිය තැපැල් කාර්යාලයේදි මෙම විත්තිකරුට දුරකථන ඇමතුමක් ලබා දී ඇය පැමිණි බව දැනුම් දි ඇත. ඉන් අනතුරුව මෙම සාක්ෂිකරු සහ පැමිණිලිකාරිය තැපැල් කාර්යාලයේ මහජනතාවට වාඩි වීමට තිබූ පුටු දෙකක වාඩි වී ඇති අතර, ඔවුන් දෙදෙනාට මැදින් තිබූ පුටුව හිස්ව තිබී ඇත. එම අවස්ථාවේදී විත්තිකරු සිවිල් ඇඳුමින් සැරසී එම ස්ථානයට පැමිණ ඔවුන් දෙදෙනා අතර තිබූ හිස් පුටුවේ වාඩි වී පැමිණිලිකාරිය සමඟ කතා කළ බවත්, බය වෙන්න එපා මම ඔයාගේ මහත්තයා හොයලා දෙන්නම්, රුපියල් 150,000/- අරගෙන ආවාද කියා විත්තිකරු පැමිණිලිකාරියගෙන් ඇසූ බවත් පවසා ඇත. ඉන් අනතුරුව පැමිණිලිකාරිය මුදල් ගෙනා බව පැවසූ විට විත්තිකරු මුදල් දෙන්න කියා ඉල්ලා සිටි අවස්ථාවේදී පැමිණිලිකාරියගේ බෑග් එකේ තිබූ පැ.4 ෂොපින් බෑග් එකේ දමන ලද රුපියල් 150,000/-ක මුදල රැගෙන විත්තිකරුට දුන් බවත්, මෙම සාක්ෂිකරු සාක්ෂි දෙමින් පවසා ඇත.

මෙම මුදල විත්තිකරු ඉල්ලා සිටි අවස්ථාවේදී පැමිණිලිකාරිය ඔහුට මුදල් ලබා දුන් බවත්, එම මුදල විත්තිකරු භාර ගත් බවත්, එය අතේ තබා ගෙන පසුව එම මුදල් ඔහුගේ දකුණු කලිසම් සාක්කුවට දා ගත් බවත් පවසා ඇත. ඉන් පසුව මෙම සාක්ෂිකරු එම ස්ථානයෙන් ඉවත්ව කණ්ඩායම් භාර නිලධාරිට සංඥාවක් ලබා දී ඇත. ඉන් අනතුරුව කණ්ඩායම් භාර නිලධාරි ලියනගේ එම ස්ථානයට පැමිණ ඇත. ඒ අවස්ථාවේදී මෙම සාක්ෂිකරු ඔහුට පවසා ඇත්තේ ඔහු වැටලීමට පෙර ලබා දුන් උපදෙස් අනුව ක්‍රියා කළ බවත්, රුපියල් 150,000/-ක අල්ලස් මුදල පැමිණිලිකාරියගෙන් භාර ගෙන විත්තිකරු ඔහුගේ කලිසමේ දකුණු සාක්කුවේ දමා

ගත් බවත් පැවසූ බව සාක්ෂි දෙමින් කියා ඇත. ඉන් පසුව පොලිස් පරීක්ෂක ලියනගේ විත්තිකරු ළඟට ගොස් ඔහුගේ හැඳුනුම්පත පෙන්වා පැමිණිලිකාරියගේ නම කියා ඇයගෙන් ලබා ගත් මුදල් ඉල්ලා සිටි බවත්, ඒ අවස්ථාවේදී විත්තිකරු බය වී මාව දාලා යන්න කියා කලිසමේ දකුණු සාක්කුවේ තිබුණු මුදල් අරගෙන ලියනගේ මහතාට භාර දුන් බවත් පවසා ඇත. ඉන් පසුව විත්තිකරුට අදාල මුදල් නෝට්ටුවල අංක සහ කණ්ඩායම් භාර නිලධාරිගේ සටහන් පොතේ සඳහන් අංක සමඟ සසඳා බලන ලෙසට දන්වා සිටිමෙන් පසුව විත්තිකරු අත්අඩංගුවට ගත් බවත් පවසා ඇත.

මෙම සාක්ෂිකරුගේ සාක්ෂියද විත්තිය විසින් දීර්ඝ වශයෙන් හරස් ප්‍රශ්නවලට භාජනය කොට ඇත. එහෙත් එම සාක්ෂියේ විශ්වසනීයත්වය පළුදු වන ආකාරයේ මෙම නඩුවේ මූලයට බලපාන කිසිදු වැදගත් පරස්පර විරෝධිතාවයක් මෙම හරස් ප්‍රශ්න ඇසීම තුළින් උද්ගතව නැත. මෙම සාක්ෂිකරු මෙම අධිකරණයේ දී ඇති සාක්ෂිය කියවා බැලීමේදී පැහැදිලිවම පෙනී යන්නේ ඔහු විසින් දී ඇති සාක්ෂිය ඒකාකාරී සාක්ෂියක් වන බවය.

මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය සහ මෙම නඩුවේ පැමිණිලිකාරිය විසින් දෙන ලද සාක්ෂිය අතරද කිසිදු පරස්පරවිරෝධිතාවයක් දක්නට නැත. විත්තියේ හරස් ප්‍රශ්න ඇසීම තුළින් ගෙන ඇති ස්ථාවරය වන්නේ මෙම නඩුවේ විත්තිකරු බුද්ධි අංශ නිලධාරියෙකු වශයෙන් එල්.ටි.ටී.ඊ ක්‍රියාකාරකම් පිළිබඳව තොරතුරු එක්රැස් කරන්නෙකු වන බැවින් වෙනත් අයවලුන්ගේ උවමනාවට එල්.ටී.ටී.ඊ ක්‍රියාකාරීන්ට වයඹ පළාතේ තවදුරටත් ඔවුන්ගේ කටයුතු දියත් කර ගෙන යාමට හැකි වනු පිණිස දියත් කරන ලද ක්‍රියාවලියක ප්‍රතිඵලයක් වශයෙන් මෙම විත්තිකරු අත්අඩංගුවට ගැනීමේ ක්රියාවලියට ඔවුන් හවුල්ව ඇති බවය. එහෙත් පැමිණිලිකාරියට හෝ උපාය දූතයා වශයෙන් කටයුතු කරන ලද නිලධාරියාට මෙම විත්තිකරුව වෙනත් අයවලුන්ගේ අවශ්‍යතාවයකට මෙම ප්‍රෙද්ශයේ එල්.ටි.ටී.ඊ ක්‍රියාකාරකම් පවත්වාගෙන යාමට උදව් කරනු වස් මෙම විත්තිකරුව බොරු නඩුවක පැටලවීමට

විත්තිය යෝජනා කරන ලද අන්දමට කිසිදු හේතුවක් තිබූ බවක් මෙම නඩුවේ සාක්ෂි මත අනාවරණය වන්නේද නැත.

මෙම වැටලීමේ කණ්ඩායම් භාර නිලධාරියා වශයෙන් කටයුතු කොට ඇති ප්‍රධාන පොලිස් පරීක්ෂක ප්‍රියන්ත ලියනගේ ගේ සාක්ෂිය වූයේ, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට මෙම නඩුවේ පැමිණිලිකාරිය විසින් 2009.05.05 වන දින කරන ලද පැමිණිල්ලට අදාලව වැටලීමක් සංවිධානය කළ බවය. මෙම පැමිණිල්ල හලාවත පොලිස් අධිකාරි කාර්යාලයේ සේවය කරන පොලිස් නිලධාරියෙකුට විරුද්ධව ඉදිරිපත් කර තිබූ බවත්, මෙම නිලධාරියා පැමිණිලිකාරියගෙන් රුපියල් 150,000/-ක මුදලක් ඉල්ලා සිටි බැවින් අදාල මුදලද ලබා ගෙන වැටලීමේ කටයුතු සිදු කිරීම සඳහා ඊට පසු දින බත්තුළුඔය පිහිටි පැමිණිලිකාරියගේ නිවසට ගිය බවත් පවසා ඇත. මෙම පැමිණිල්ලට අනුව පැමිණිලිකාරියගේ ස්වාමි පුරුෂයා නාඳුනන කණ්ඩායමක් විසින් පැහැර ගෙන ගොස් තිබූ බවත්, ඒ අනුව ඔහුව සොයා දීම සඳහා හලාවත පොලිස් අධිකාරි කාර්යාලයේ බුද්ධි අංශයේ සේවය කරන පියරත්න නැමැති නිලධාරියා අදාල මුදල ඉල්ලා ඇති බවත් මෙම සාක්ෂිකරු සාක්ෂි දෙමින් පවසා ඇත.

පැමිණිලිකාරියගේ නිවසට පැමිණ ඇති නිලධාරින් කණ්ඩායම පැමිණිලිකාරිය වැටලීමට සහාය දීමට එකඟද යන්න විමසා ඇති අතර, ඇය එකඟත්වය පළ කල පසුව මෙම වැටලීම සංවිධානය කොට ඇත. ඇය විසින් උපාය දූතයා වශයෙන් පොලිස් කොස්තාපල් වමින්ද තෝරා ගෙන ඇති අතර, මුදල් ඉල්ලා සිටි නිලධාරියාට මුදල් සොයා ගෙන ඇති බව දුරකථනයෙන් දැනුම් දෙන ලෙසට පැමිණිලිකාරියට උපදෙස් දී ඇත. එමෙන්ම, මින් පෙර ලබා ගත් ලක්ෂ තුන පිළිබඳව කතා කරන ලෙසත්, එම නිලධාරියා මුදල් ඉල්ලා සිටියොත් එම මුදල ලබා දෙන ලෙසත්, ස්වාමි පුරුෂයාව සොයා දීමට හැකියාවක් නැති බවට කීවොත් ආපසු එන ලෙසටත් බලෙන් මුදල් නොදෙන ලෙසටත් පැමිණිලිකාරියට උපදෙස් දුන් බව ඔහු වැඩිදුරටත් සාක්ෂි දෙමින් පවසා ඇත..

මෙම සාක්ෂිකරුට අනුව පැමිණිලිකාරිය ඇයගේ නිවසේ කාමරය තුළ තිබුණු ස්ථාවර දුරකථනයෙන් කතා කොට ඇති අතර, එම දුරකථනයට සම්බන්ධ කර සාලයේ තිබූ දුරකථනයෙන් මෙම දුරකථන සංවාදයට මෙම සාක්ෂිකරු සවන් දී ඇත. මෙම දුරකථන ඇමතුම ලබා දුන් ජංගම දුරකථන අංකය 071-8196900 බවත්, පැමිණිලිකාරිය සහ දුරකථනයේ අනික් කෙළවරේ සිටි තැනැත්තා අතර සිදු වූ කතා බහ සම්බන්ධයෙන් මෙම සාක්ෂිකරු සටහන් යොදා ඇති බවත් පවසා ඇත. එම සටහන් පරිශීලනය කරමින් මෙම සාක්ෂිකරු සාක්ෂි ලබා දී ඇත. දුරකථනයේ අනික් කෙළවරේ කතා කළ තැනැත්තා පිරිමි තැනැත්තෙකු බවත්, පැමිණිලිකාරිය එම තැනැත්තාගෙන් ඇයගේ පුරුෂයා පිළිබඳව ආරංචි මොනවාද කියා විමසූ බවත්, එම අවස්ථාවේදී එම පුද්ගලයා ඒ වැඩේට ගොඩාක් මහන්සි වෙනවා එයාගේ යාළුවන්ටත් කියලා තියෙන්නේ කියා පැවසූ බවත්, පැමිණිලිකාරියගෙන් ඉල්ලා ඇතැයි කියන රුපියල් 150,000/- මුදල පිළිබඳවද දෙදෙනා අතර අදහස් හුවමාරු කර ගැනීමක් සිදු වූ බවත් පවසා ඇත. එම කතා බහේදී දුරකථනයේ අනික් කෙළවරේ සිටි තැනැත්තා පැමිණිලිකාරියගෙන් රුපියල් 150,000/-ක මුදලක් ඉල්ලා සිටි බව පවසා ඇත. එමෙන්ම, රුපියල් 350,000/- පිළිබඳවද පැමිණිලිකාරිය එම තැනැත්තාගෙන් විමසූ විට පැමිණිලිකාරිය ඔහුට ලබා දුන් එකී මුදල කොළඹ ගිහින් ඒ අයට හොඳට සැලකූ බවත්, මේවා නිකම් කරන්න පුළුවන් වැඩ නෙවෙයි කියා පැවසූ බවත් ඔහුගේ සාක්ෂිය විය.

මෙම වැටලීමට අදාල රුපියල් 150,000/-ක මුදල ලබා ගැනීම සම්බන්ධයෙන්ද පැමිණිලිකාරිය හා දුරකථනයේ අනික් කෙළවරේ සිටි තැනැත්තා සමඟ ඇති වූ කතා බහ සම්බන්ධයෙන්ද මෙම සාක්ෂිකරු සාක්ෂි ලබා දී ඇත. ඔහුට අනුව පැමිණිලිකාරිය එම තැනැත්තාට මුදල් රැගෙන යාමට ගෙදරට පැමිණෙන ලෙස කියා සිටි අවස්ථාවේ වැඩ ගොඩ ගැසී ඇති බැවින් දැන්ගෙදරට එන්න විදියක් නැති බවත්, සල්ලිත් අරගෙන හලාවතට එන්න කියා පවසා ඇත. දුරකථනයේ අනික් කෙළවරේ සිටි තැනැත්තා පැමිණිලිකාරියට මුදල් රැගෙන හලාවත තැපැල් කන්තෝරුව අසලට පැමිණෙන ලෙස කියා සිටි බවත්, ගෙදරින් පිටත් වන විට ඔහුට කෝල් එකක් දෙන්නම් කියා පැමිණිලිකාරිය කියා සිටි බවත්, අනික්

පුද්ගලයා හා කියා දුරකථනය විසන්ධි කළ බවත් මෙම සාක්ෂිකරු වැඩිදුරටත් සාක්ෂි දෙමින් පවසා ඇත. ඉන් පසුව මෙම සාක්ෂිකරු වැටලීම සඳහා අවශ්‍ය උපදෙස් ලබා දි රුපියල් 150,000/-ක මුදල පැ.4 වශයෙන් ලකුණු කර ඇති ෂොපින් බෑග් එකේ දමා පැමිණිලිකාරියට දුන් බවත් පවසා ඇත. මෙම වැටලීම සඳහා ඔවුන් හලාවත බලා පිටත් වීමට පෙර නැවතත් පැමිණිලිකාරියගේ නිවසේ දුරකථනය නාද වී ඇති අතර, පැමිණිලිකාරිය දුරකථනයට පිළිතුරු සැපයීමට රිසිවරය ගත් අවස්ථාවේදී මෙම සාක්ෂිකරුද සාලයේ දුරකථනයෙන් ඊට සවන් දී ඇත. පෙර කතා කළ පුද්ගලයා හලාවතට පැමිණ ඔහුට කෝල් එකක් දෙන්න කියාත් මතක් කරලා ඔහුගේ දුරකථන අංකයත් ලියා ගෙන එන්න කියා පවසා දුරකථනය විසන්ධි කළ බවත් මෙම සාක්ෂිකරු සාක්ෂි දෙමින් පවසා ඇත.

ඉන් අනතුරුව පැමිණිලිකාරිය සහ මෙම සාක්ෂිකරු ඇතුළු විමර්ශන නිලධාරින් කණ්ඩායම හලාවත නගරයට පැමිණ ඇත. මෙම සාක්ෂිකරු පැමිණිලිකාරියට සහ උපාය දූතයා වශයෙන් කටයුතු කොට ඇති චමින්ද නිලධාරියාට අදාල උපදෙස් අනුව ක්‍රියා කරන ලෙසට දන්වා තැපැල් කාර්යාලය ආසන්නයේ අනික් පස ස්ථාන ගත වී ඇත. පැමිණිලිකාරිය සහ විමර්ශන නිලධාරි චමින්ද තැපැල් කාර්යාලය තුළට ගිය බවත්, ඔවුන් තැපැල් කාර්යාලයට ගොස් ටික වෙලාවකින් පසුව චමින්ද නැමැති නිලධාරියා තැපැල් කාර්යාලයේ දොර ළඟට පැමිණ අතින් සංඥාවක් ලබා දුන් බවත් පවසා ඇත. ඉන් පසුව මෙම සාක්ෂිකරු තැපැල් කාර්යාලයට ගොස් චමින්ද නිලධාරියා හමු වී ඇති අතර, තැපැල් කාර්යාලය තුළ සිටි විත්තිකරුව පෙන්වා ඔහු අල්ලස් මුදල වන රුපියල් 150,000/- අරගෙන ඔහුගේ කලිසමේ දකුණු සාක්කුවේ දා ගත් බව දැනුම් දී ඇත. ඒ අනුව මෙම සාක්ෂිකරු මෙම විත්තිකරු අසලට ගොස් ඔහුගේ හැඳුනුම්පත පෙන්වා පැමිණිලිකාරියගෙන් ලබා ගත් රුපියල් 150,000/-ක මුදල ඉල්ලා සිටි බවත්, ඒ අවස්ථාවේ ඔහු බය වුනු ආකාරයෙන් ඔහු දෙස බලා සිට යමක් පවසා ඔහුගේ දකුණු කලිසම් සාක්කුවේ තිබූ මුදල් අරගෙන ඔහුට දුන් බවත්, එම මුදල් ගණන් කොට සටහන් පොතේ ඇති නෝට්ටු අංක සමඟ සසඳා බැලූ බවත් පවසා ඇත. මෙම මුදල් පැමිණිලිකාරියට මෙම වැටලීම සඳහා ලබා දුන් මුදල් බවට තහවුරු වූ බවත්, ඒවා

සසඳා බලන ලෙස විත්තිකරුට දැන් වූ බවත්, ඔහු කොළ කිහිපයක් පරීක්ෂා කර බලා අනික් ඒවා පරීක්ෂා කරන්න අවශ්‍ය නැති බව පැවසූ බවත්, ඉන් පසුව විත්තිකරුට චෝදනාව කියවා දී අත්අඩංගුවට ගත් බවත් පවසා ඇත. මෙම විත්තිකරු සහ අදාල මුදල අධිකරණයට ඉදිරිපත් කොට ඇති අතර, එම මුදල්වලට අදාලව කොළඹ මහේස්ත්‍රාත්වරයා විසින් 2009.05.19 වන දින නිකුත් කරන ලද මුදල් සහතිකය පැ.5 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කර ඇත.

මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය විත්තිය විසින් දීර්ඝ වශයෙන් හරස් ප්‍රශ්නවලට භාජනය කොට ඇත. මෙම හරස් ප්‍රශ්න ඇසීම තුළින් මෙම සාක්ෂිකරුගේ සාක්ෂියෙහි මෙම නඩුවේ හරයට බලපාන කිසිදු පරස්පරවිරෝධිතාවයක් උද්ගතව නොමැත. මෙම සාක්ෂිකරු මෙම අධිකරණයේ ඒකාකාරී සාක්ෂියක් ලබා දී ඇති බව එම සාක්ෂිය මනාව කියවා බැලීමේදී තහවුරු වන කරුණකි. මෙම සාක්ෂිකරුගේ සාක්ෂියේ විශ්වසනීයත්වයට පහර වදින ආකාරයේ පැමිණිල්ලේ නඩුවේ මූලයට බලපාන කිසිදු පරස්පරවිරෝධිතාවයක් උද්ගතව නැත. ඒ අනුව මෙම සාක්ෂිකරුගේ සාක්ෂියේ විශ්වසනීයත්වයට කිසිදු බලපෑමක් එල්ල වී නොමැති බව මෙම අධිකරණයේ මතය වන්නේය. මෙම සාක්ෂිකරුගේ සාක්ෂියත් පැමිණිලිකාරියගේ සාක්ෂිය හා උපාය දූතයා වශයෙන් කටයුතු කොට ඇති විමර්ශන නිලධාරි චමින්ද යන අයගේ සාක්ෂිත් අතර (Interse) කිසිදු පරස්පරවිරෝධිතාවයක්ද දක්නට නොමැත.

මෙම නඩුවේ විත්තිකරු විසින් විත්ති කූඩුවේ සිට කරන ලද ප්‍රකාශයෙහි මෙම නඩුවේ පැමිණිලිකාරිය ඔහුව යම් දිනෙක ඔහුගේ කාර්යාලයේදී හමු වූ බව පිළිගෙන ඇත. එම අවස්ථාවේදී පැමිණිලිකාරිය ඇයගේ ස්වාමි පුරුෂයාගේ අතුරුදහන් වීම සම්බන්ධයෙන් ඔහුට තොරතුරු දන්වා සිටි බවත් පවසා ඇත. ඒ සම්බන්ධයෙන් සොයා බලන්නම් කියා ඒ අවස්ථාවේදී පැමිණිලිකාරියට කියා සිටින්නට ඇති බවත්, එදින ඇය ඔහුගේ දූරකථන අංකය ඉල්ලා සිටි බවත්, ඒ අනුව ඇයට දූරකථන අංකය ලබා දුන් බවත්, මොකක් හෝ තොරතුරක් විත්තිකරු දැන ගත්තොත් ඇයට ලබා දීම සඳහා ඇයගේ දූරකථන අංකයද විත්තිකරුට ලබා දුන්

බවත් ඔහුගේ සාක්ෂිය විය. විත්තිකරුට අනුව පැමිණිලිකාරිය කිහිප වතාවක්ම දුරකථනයෙන් ඔහුට කතා කොට මේ සම්බන්ධයෙන් විමසා සිටි නමුත් මෙම අතුරුදහන් වූ පුද්ගලයා සම්බන්ධයෙන් සොයා බැලීමට හෝ විමර්ශනය කිරීමට නොගිය බවත් පවසා ඇත.

පැමිණිලිකාරිය කියා සිටින අන්දමට රුපියල් 350,000/-ක අල්ලස් මුදලක් ඉල්ලා භාර නොගත් බවත්, රුපියල් 150,000/-ක මුදලක් ඉල්ලා අල්ලස් නිලධාරින් ඉදිරිපිට ලබා ගත් බවට පැමිණිලිකාරිය දෙන ලද සාක්ෂියද අසත්‍ය සාක්ෂියක් බවත් විත්තිකරු විත්ති කූඩුවේ සිට පවසා ඇත. ඔහු වැඩිදුරටත් ප්‍රකාශ කොට ඇත්තේ, මෙම සිද්ධිය වූ දින දුරකථනයෙන් රුපියල් 150,000/-ක් පැමිණිලිකාරියගෙන් ඉල්ලුවේ නැති බවත්, තැපැල් කන්තෝරුවේදී පැමිණිලිකාරිය ළඟට පැමිණ කෝ 150,000/- ගෙනාවද කියා විමසුවේ නැති බවත් පවසා ඇත. එදින විත්තිකරු තොඩුවාව ප්‍රදේශයේ සිටින විට පැමිණිලිකාරිය දුරකථන ඇමතුමක් දී ඔහුව හමු වීමට අවශ්‍ය බවත්, කාර්යාලයට එන්නද කියා විමසූ බවත් පවසා ඇත. මෙම විත්තිකරු එම අවස්ථාවේ ඔහු කාර්යාලයේ නැති බවත්, අවශ්‍යතාවය කියන ලෙසත් පැවසූ අවස්ථාවේ හමු වී කියන්නම් කියා පැවසූ බවත්, එළියේ ඉන්නවා නම් ගෙදර එන්න කියා පැවසූ බවත්, ගෙදර ඒමට බැරි බව පවසා දුරකථනයෙන් අවශ්‍යතාවය කියන ලෙස ඇයට දැන්වූ බවත් ඔහුගේ සාක්ෂිය විය. කෙසේ හෝ ඇය විත්තිකරුව හමු වීමට අවශ්‍ය යැයි ඇවිටිලි කළ බැවින් ඔහු විනාඩි 20කින් හෝ 30කින් හලාවත තැපැල් කාර්යාලයට එන බවත්, එතනට පැමිණ එම වැදගත් තොරතුර ලබා දෙන ලෙස කියා සිටි බවත් පවසා ඇත. විත්තිකරු තැපැල් කන්තෝරුවට ගිය බව පවසා ඇති අතර, පැමිණිලිකාරිය සාමාන්‍ය ජනතාවට වාඩි වීමට ඇති ආසනයක වාඩි වී සිටිනවාද දැක ඇත. විත්තිකරුට අනුව ඔහු ඇය ළඟට ගොස් මොකක්ද තොරතුර කියා විමසා ඇත. එවිට පැමිණිලිකාරිය සර්, වාඩි වෙන්න මම කියන්නම් කියා පැවසූ විට එතන තිබූ හිස් පුටුවේ වාඩි වූ බවත්, එම අවස්ථාවේ ඇය ග්‍රොසරි බෑගයක ඔතා ගත් මුදල් ඔඩොක්කුවේ ඔහුගේ තිබ්බ බවත්, ක්ෂණිකව ඒ ඇයගේ ඔඩොක්කුවට දමා නැගිටලා යන්න යද්දි අල්ලස් නිලධාරින් පැමිණ ඔහුව වට කොට ඔහු ලබා ගත් මුදල් ඉල්ලා සිටි බවත් මුදල් ගත්තේ නැතැයි

කිවු නමුත් ඔවුන් එය විශ්වාස නොකොට ඒ අවස්ථාවේ ඔහුව අත්අඩංගුවට ගත් බවත් පවසා ඇත. විත්තිකරු විත්ති කූඩුවේ සිට කරන ලද ප්‍රකාශයද සාක්ෂියක් වශයෙන් අඩුලුහුඩුකම් දෙකකට යටත්ව සලකා බැලිය යුතුය. එනම්, විත්තිකරු දිවුරුම් පිට එම ප්‍රකාශය ලබා නොදීමත්, එය හරස් ප්‍රශ්නවලට භාජනය නොවීමත් යන අඩුපාඩු දෙකට යටත්ව විත්තිකරුගේ සාක්ෂිය සලකා බැලිය යුතුය. විත්තිකරු විත්ති කූඩුවේ සිට කරන ලද ප්‍රකාශයෙන් පැමිණිල්ලේ නඩුව සම්බන්ධයෙන් සාධාරණ සැකයක් උද්ගත වන්නේ නම්, එම සැකයේ වාසිය විත්තිකරුට ලබා දී ඔහු මෙම නඩුවේ චෝදනාවලින් නිදොස් කොට නිදහස් කළ යුතුය.

විත්තිකරු විත්ති කූඩුවේ සිට කරන ලද ප්‍රකාශයෙන් පැමිණිලිකාරිය මෙම විත්තිකරු පොලිස් අධිකාරි කාර්යාලයේ රාජකාරියේ නිරතව සිටි දවසක ඔහු හමු වීමට පැමිණ ඇයගේ ස්වාමි පුරුෂයාගේ අතුරුදහන් වීම සම්බන්ධයෙන් ඔහුට දැනුම් දී ඒ ගැන සොයා බලන ලෙසට ඉල්ලීමක් කරන ලද බවත් විත්තිකරුගේ සහ පැමිණිලිකාරියගේ දූරකථන අංකයන් හුවමාරු කර ගත් බවත්, අවස්ථා කිහිපයකදී පැමිණිලිකාරිය දූරකථනයෙන් ඔහු සමඟ කතා බහ කළ බවත් පිළිගෙන ඇත. එමෙන්ම, මෙම සිද්ධිය සිදු වූ දිනද පැමිණිලිකාරිය ඔහුට දූරකථනයෙන් කතා කළ බවද පිළිගෙන ඇත. විත්තිකරු පැමිණිලිකාරියගෙන් රුපියල් 350,000/-ක මුදලක් මෙම වැටලීමට පෙර ඉල්ලා භාර ගත් බව සහ වැටලීම සිදු කළ දිනයේ දූරකථනය මඟින් සහ තැපැල් කාර්යාලයේදී රුපියල් 150,000/-ක මුදලක් පැමිණිලිකාරියගෙන් ඉල්ලා භාර ගත් බව ප්‍රතික්ෂේප කොට ඇත. ඔහුගේ සාක්ෂිය වූයේ පැමිණිලිකාරියට වැදගත් තොරතුරක් විත්තිකරුට ලබා දීමට අවශ්‍ය බව පවසා ඔහුව කෙසේ හෝ හමු වීමට අවශ්‍ය බව දැන් වූ හෙයින් තැපැල් කාර්යාලයේදී ඔහුව හමු වන ලෙසට ඇයට දැනුම් දුන් බවය. ඒ අනුව තැපැල් කාර්යාලයේදී ඇය අසල පුටුවේ වාඩි වූ අවස්ථාවේදී මුදල් අඩංගු පාර්සලය ඔහුගේ ඔඩොක්කුවට දැමූ අවස්ථාවේ ඔහු එය ප්‍රතික්ෂේප කොට පැමිණිලිකාරියගේ ඔඩොක්කුවට ආපසු දැමූ බව ඔහුගේ ස්ථාවරය විය.

පැමිණිලිකාරිය සාක්ෂි දෙමින් පැහැදිලිවම කිසිදු පරස්පර විරෝධිතාවයකින් තොරව පවසා ඇත්තේ ඇයගෙන් ඇයගේ ස්වාමි පුරුෂයා සොයා දෙන බවට පොරොන්දු වී මෙම වැටලිමට අදාල සිද්ධියට මාස තුනකට පමණ පෙර රුපියල් 350,000/-ක මුදලක් ඉල්ලා එම මුදල ඇයගේ නිවස ආසන්නයේදී ලබා ගත් බවය. එම මුදල සොයා ගැනීම සඳහා ඇය සතුව තිබූ රන් භාණ්ඩ උකස් තබන ලද බව සනාථ කිරිම සඳහා පැ.1, 2, 3 යන උකස් පත්‍රිකා ඇය විසින් මෙම අධිකරණයට ඉදිරිපත් කොට ඇත. ඉතිරි මුදල ඇය බැංකු පොතකින් ලබා ගත් බව පවසා ඇත. මෙම සාක්ෂිකාරිය විසින් දෙන ලද සාක්ෂිය සහ මෙම සාක්ෂිය සනාථ කිරිම සඳහා ලකුණු කොට ඉදිරිපත් කර ඇති පැ.1 සිට පැ.3 දක්වා ලකුණු කොට ඇති උකස් පත්රිකා හැර වෙනත් ස්වාධින සාක්ෂියක් පැමිණිල්ලෙන් ඉදිරිපත්ව නැත. එසේ වූවද විත්තිකරුවකුට විරුද්ධව චෝදනාවක් ඔප්පු කිරීම සඳහා සාක්ෂිකරුවන් මෙපමණ සංඛ්‍යාවක් කැඳවිය යුතු යැයි නීතියෙන් කිසිම නියමයක් කොට නැත. එක් සාක්ෂිකරුවකුගේ සාක්ෂියක් පමණක් විත්තිකරුවකු වරදකරුවෙකු කිරිමට ප්‍රමාණවත්ය. එම සාක්ෂිකරු විසින් දෙනු ලබන සාක්ෂිය විශ්වසනීයත්වයෙන් යුක්ත සාක්ෂියක් වන්නේ නම්, ඒ සාක්ෂිය මත පමණක් කටයුතු කිරිමට නීතිමය බාධාවක් නොමැත. මෙම සාක්ෂිකාරියගේ සාක්ෂිය දීර්ඝ වශයෙන් හරස් ප්‍රශ්නවලට භාජනය වූවද ඇය මෙම අධිකරණයේ අසත්‍ය සාක්ෂියක් දෙන බවට හෝ හිතාමතා විත්තිකරුව අසත්‍ය නඩුවකට පැටලැවීමට කටයුතු කරන බවට කිසිදු කරුණක් උද්ගතව නැත. ඇය මෙම අධිකරණයේ දෙන ලද සාක්ෂිය මෙම අධිකරණයට පිළිගත නොහැකි අසත්‍ය සාක්ෂියක් වශයෙන් සලකා බැහැර කිරිමට කිසිදු කරුණක්ද උද්ගතව නැත.

පැමිණිලිකාරිය ඇයගේ සාක්ෂියේදී ඉතා පැහැදිලිවම කිසිදු පරස්පර විරෝධිතාවයකින් තොර ඒකාකාරි සාක්ෂියක් ලබා දෙමින් පවසා ඇත්තේ, ඇයගේ ස්වාමි පුරුෂයා සොයා දීම සඳහා රුපියල් 150,000/-ක මුදලක් විත්තිකරු අයැද සිටි බවය. මෙම වැටලීම සිදු කළ දිනයේද ඇය දුරකථනයෙන් විත්තිකරුට අමතා මෙම මුදල පිළිබඳව කතා බහ කළ අවස්ථාවේද විත්තිකරු එය ඉල්ලා සිටි බවත්, එම මුදල රැගෙන හලාවත තැපැල් කාර්යාලයට පැමිණෙන ලෙසට දැන් වූ බවත් කිසිදු

පැකිලීමකින් තොරව සාක්ෂි දෙමින් පවසා ඇත. එමෙන්ම හලාවත තැපැල් කාර්යාලය තුළදී මෙම විත්තිකරු මුදල් ඉල්ලා සිටි අවස්ථාවේදී ඇය ඔහුට රුපියල් 150,000/-ක මුදල ලබා දුන් බව කිසිදු පරස්පරතාවයකට ලක් නොවූ සාක්ෂියක් දෙමින් ඇය පවසා ඇත. පැමිණිලිකාරිය විසින් දෙන ලද සාක්ෂිය උපාය දූතයා වශයෙන් මෙම වැටලීමට සහභාගි වූ විමර්ශන නිලධාරි චමින්දගේ සාක්ෂියෙන්ද අනුසංන්දනය වී ඇති බවද සඳහන් කළ යුතුය.

ඒ අනුව විත්තිකරු මෙම වැටලීම සිදු කළ දිනයේදී හලාවත තැපැල් කාර්යාලය තුළදී රුපියල් 150,000/-ක මුදල පැමිණිලිකාරියගෙන් ඉල්ලා භාර ගත් බව පැමිණිලිකාරියගේ සහ විමර්ශන නිලධාරි චමින්දගේ සාක්ෂියෙන් ඔප්පු වී ඇත. මෙම රුපියල් 150,000/-ක මුදල විත්තිකරුගේ භාරයේ තිබී විත්තිකරු විසින් තැපැල් කාර්යාලය තුළදී ඔහුට ලබා දුන් බව කණ්ඩායම් භාර නිලධාරි පොලිස් පරීක්ෂක ලියනගේ ගේ සාක්ෂිය මඟින් තහවුරුව ඇත.

මෙම නඩුවේ විත්තිකරුට විරුද්ධව මෙම පැමිණිලිකාරියට අසත්‍ය පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමට කිසිදු හේතුවක් තිබූ බවක් අනාවරණය වන්නේ නැත. විත්තිකරු පැමිණිලිකාරියගෙන් මෙම වැටලීමට පෙර ඇයගේ ස්වාමි පුරුෂයා සොයා දෙන බවට පොරොන්දු වී රුපියල් 350,000/-ක මුදලක් ලබා ගත් බවටත් ඉන් පසුව තවත් රුපියල් 150,000/-ක් අල්ලස් වශයෙන් ඉල්ලා වැටලීම සිදු කරන ලද දිනයේදී එකී මුදල විත්තිකරු භාර ගත් බවටත් මෙම විත්තිකරුට විරුද්ධව අසත්‍ය සාක්ෂියක් මෙම අධිකරණයේ පැවසීමට මෙම පැමිණිලිකාරියට කිසිදු හේතුවක් තිබූ බවක්ද අනාවරණය වන්නේ නැත. එමෙන්ම, උපාය දූතයා වශයෙන් කටයුතු කළ විමර්ශන නිලධාරි චමින්දට හෝ පොලිස් පරීක්ෂක ලියනගේට මෙම විත්තිකරුව බොරු නඩුවකට පටලැවීම සඳහා හිතාමතා බොරු වැටලීමක් සංවිධානය කිරීමට හෝ ඔහුට විරුද්ධව අසත්‍ය සාක්ෂි ලබා දීමට කිසිදු හේතුවක් තිබූ බවක්ද අනාවරණය වන්නේ නැත. විත්තිය හරස් ප්‍රශ්න ඇසීම තුළින් ගෙන ඇති ස්ථාවරය වන්නේ විත්තිකරු බුද්ධි අංශ නිලධාරියෙකු නිසා එල්.ටී.ටී.ඊ සංවිධානය සම්බන්ධයෙන් තොරතුරු එක්රැස් කිරීම වැළැක්වීම සඳහා වෙනත්

අයවලුන්ගේ උවමනාවට මෙම අසත්‍ය පැමිණිල්ල කරන ලද බවය. එහෙත් පැමිණිලිකාරියට ඒ ආකාරයෙන් ක්‍රියා කිරීමේ කිසිදු අවශ්‍යතාවයක් තිබූ බවක් මෙම නඩුවේ ඉදිරිපත් වූ සාක්ෂිවලින් අනාවරණය වන්නේ නැත. එමෙන්ම පැමිණිලිකාරිය විත්තිකරුගෙන් නිතරම ඇයගේ ස්වාමි පුරුෂයා පිළිබඳව තොරතුරු ලබා ගැනීමට විත්තිකරුව අමතා ඇත. යම්කිසි තොරතුරක් පැමිණිලිකාරිය විත්තිකරුගෙන් බලාපොරොත්තු වූවා මිස පැමිණිලිකාරිය විත්තිකරුට තොරතුරු ලබා දීමක් අපේක්ෂා කළ බව මෙම නඩුවේ කරුණු අනුව අනාවරණය වන්නේද නැත. ඒ අනුව විත්තිකරුට වැදගත් තොරතුරක් ලබා දීම සඳහා පැමිණිලිකාරියට ඔහුව මෙම වැටලීම සිදු කළ දිනයේදී හමු වීමට අවශ්‍ය බවට ඇය දැන්වූ බවට විත්තිකරු විසින් විත්ති කූඩුවේ සිට කරන ලද ප්‍රකාශය පිළිගත නොහැකිය. මන්ද පැමිණිලිකාරිය ඇයගේ පුරුෂයා සම්බන්ධයෙන් යම් තොරතුරක් ලබා ගැනීමට බලාපොරොත්තුව සිටියේ මෙම විත්තිකරුගෙන් බැවිනි.

විත්තිකරුට පැමිණිලිකාරිය වැටලීම සිදු වූ දිනයේදී දුරකථන ඇමතුමක් ලබා දුන් බවත්, ඔහු හමු වීමට හලාවත තැපැල් කාර්යාලයට පැමිණෙන ලෙස දැනුම් දුන් බවත්, විත්ති කූඩුවේ සිට මෙම විත්තිකරු කරන ලද ප්‍රකාශයෙන් පිළිගෙන ඇත. පැමිණිලිකාරිය සාක්ෂි දෙමින් පවසා ඇත්තේ, රුපියල් 150,000/-ක මුදල රැගෙන තැපැල් කාර්යාලයට පැමිණෙන ලෙස විත්තිකරු දැනුම් දුන් බවය. පැමිණිලිකාරියට අනුව විමර්ශන නිලධාරින් ඇයගේ නිවසට පැමිණි පසුව ඔවුන්ගේ උපදෙස් මත විත්තිකරුට දුරකථන ඇමතුමක් ලබා ගැනීමට උපදෙස් දී ඇති අතර, එම සංවාදයට කණ්ඩායම් භාර නිලධාරි ලියනගේ ඇහුම්කන් දී ඇත. ඒ අනුව පැමිණිලිකාරිය කතා කරන අවස්ථාවේදී දුරකථනයේ අනික් කෙළවරේ සිට කතා කරන ලද තැනැත්තා විත්තිකරු බව මෙම සාක්ෂි අනුව සනාථ වී ඇති බව මෙම අධිකරණයේ අදහස වන්නේය. එම සංවාදයේදී විත්තිකරු පැමිණිලිකාරියගෙන් පෙර දී ලබා ගත් රුපියල් 350,000/- මුදල පිළිබඳවත් වැටලීම සිදු කළ දින ලබා ගත් 150,000/- පිළිබඳවත් කතා බස් කොට ඇත. එලෙස දුරකථනයේ අනික් කෙළවරේ සිට මුදල් ඉල්ලා සිටි තැනැත්තා ඉදිරිපත් වූ සාක්ෂි අනුව විත්තිකරු බව

ඉදිරිපත් වූ සාක්ෂි වලින් සනාථ වී ඇති බවද මෙම අධිකරණයේ නිගමනය වන්නේය.

ඒ අනුව විත්තිකරු පැමිණිලිකාරියගෙන් රුපියල් 350,000/-ක් සහ රුපියල් 150,000/-ක මුදලක් කිසි දිනෙක ඉල්ලුවේ නැති බවත්, එවැනි මුදලක් භාර ගත්තේ නැති බවටත් ඔහු විසින් විත්ති කූඩුවේ සිට කරන ලද ප්‍රකාශය තුළින් පැමිණිල්ලේ නඩුව සම්බන්ධයෙන් කිසිදු සාධාරණ සැකයක් උද්ගත නොවන අතර, එම කරුණ සම්බන්ධයෙන් මෙම විත්තිකරු විත්ති කූඩුවේ සිට කරන ලද ප්‍රකාශය පිළිගැනීම ප්‍රතික්ෂේප කරමි.

ඉහතකී කරුණු අනුව මෙම නඩුවේ විත්තිකරු මෙම නඩුවේ පැමිණිලිකාරිය වන දනන්සූරිය අප්පුහාමිලාගේ අශෝකා දනන්සූරිය නැමැත්තියගෙන් 2008.12.20 දින සිට 2009.02.03 දින අතර කාලයේදී රුපියල් 350,000/-ක තුටු පඩුරක්ද 2009.04.23 වන දින එකී පැමිණිලිකාරියගෙන් රුපියල් 150,000/-ක මුදලක් තුටු පඩුරක් වශයෙන් ඉල්ලා භාර ගෙන ඇති බවත් පැමිණිල්ල විසින් සාධාරණ සැකයෙන් තොරව ඔප්පු කොට ඇති බව තීරණය කරමි.

මෙම නඩුවේ විත්තිකරුට විරුද්ධව 1, 3, 5 සහ 7 චෝදනා නගා ඇත්තේ අල්ලස් පනතේ 16ආ උප වගන්තිය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් කරන ලද බවටය. මෙම නඩුවේ සාක්ෂිවලට අනුව එම වගන්තියේ සඳහන් පරිදි මෙම විත්තිකරු පොලිස් නිලධාරියෙකු වශයෙන් සිටිමින් යුක්තිය පසිඳලීමට බාධා කිරීම හෝ යම් වරදක් කරවීම හෝ කිරීමට පහසුකම් ලබා දීම හෝ යම් වරදක් කරන්නා සොයා ගනු ලැබීමෙන් හෝ දඬුවම් කරනු ලැබීමෙන් ආරක්ෂා කිරීම සඳහා ඉහත කී මුදල් ලබා ගෙන ඇති බව සාක්ෂි මත අනාවරණය වන්නේ නැත. මෙම නඩුවේ සාක්ෂි මඟින් අනාවරණය වූයේ යම් කණ්ඩායමක් විසින් පැහැර ගනු ලැබුවා යැයි කියනු ලබන පැමිණිලිකාරියගේ ස්වාමි පුරුෂයා සොයා දීම සඳහා ඉහත කී මුදල් විත්තිකරු පැමිණිලිකාරියගෙන් ඉල්ලා ලබා ගෙන ඇති බවය. ඒ අනුව අල්ලස් පනතේ 16අ වගන්තියේ සඳහන් යම් ක්‍රියාවක් කිරීම සඳහා විත්තිකරු පොලිස් නිලධාරියෙකු ඉහත කී මුදල් ලබා ගෙන ඇති බව ඔප්පු වී නොමැත. ඒ අනුව

විත්තිකරුට විරුද්ධව නගා ඇති 1, 3, 5 සහ 7 යන චෝදනාවලින් චූදිත නිදොස් කොට නිදහස් කරමි.

මෙම නඩුවේ විත්තිකරු මෙම නඩුවට අදාල වරද සිදු වන දිනය වන විට රජයේ සේවකයෙකු බවත්, උප පොලිස් පරීක්ෂකවරයෙකු වශයෙන් හලාවත බුද්ධි අංශයේ ස්ථානාධිපති වශයෙන් සේවය කළ බවත්, ඔහුට කිසිදු තුටු පඩුරක් රජයේ සේවකයෙකු වශයෙන් අයැදීමට හෝ භාර ගැනීමට අයිතිවාසිකමක් නැති බවත් පිළිගෙන ඇත. මෙම නඩුවේ පැමිණිල්ල විසින් මෙහෙයවන ලද සාක්ෂිවලින් මෙම නඩුවේ විත්තිකරු 2008.12.20 වන දින සිට 2009.02.03 වන දින අතර කාලය තුළදී රුපියල් 350,000/-ක මුදලක් සහ 2009.04.23 වන දින රුපියල් 150,000/-ක මුදලක් තුටු පඩුරක් වශයෙන් මෙම නඩුවේ පැමිණිලිකාරිය වන අශෝකා දනන්සූරිය නැමැත්තියගෙන් අයැද භාර ගත් බව පැමිණිල්ල විසින් සාධාරණ සැකයෙන් ඔබ්බට ඔප්පු කොට ඇත. ඒ අනුව චූදිතට රජයේ සේවකයෙකු වශයෙන් තුටු පඩුරක් අයැදීමට හෝ භාර ගැනීමට නීත්‍යානුකූල හිමිකමක් නොමැත. ඒ අනුව විත්තිකරුට විරුද්ධව නගා ඇති 2, 4, 6 සහ 8 චෝදනා පැමිණිල්ල විසින් සාධාරණ සැකයෙන් ඔබ්බට පැමිණිල්ල විසින් ඔප්පු කොට ඇති බවට තීරණය කරමි. ඒ අනුව චූදිත මෙම නඩුවේ 2, 4, 6 සහ 8 යන චෝදනාවන්ට වරදකරු කරමි.

(පියසේන රණසිංහ),

මහාධිකරණ විනිසුරු - අංක 7, කොළඹ.

2017.06.28.

H.C. 1907 හිමිකරු 2017.6.28

1) අද දින විත්තිකරු මෙම අධිචෝදනාවේ 2, 4, 6, 8 චෝදනාවලට වරදකරු කරමි. විත්ති 1, 3, 5, 7 චෝදනාවලින් නිදොස් කර නිදහස් කරමි.

විත්තිට 2 වන චෝදනාවට වසර 07 ක බරපතල වැඩ සහිත සිර දඬුවම් නියම කරමි. ඊට අමතරව රු: 5000/- ක දඩ නියම කරමි. දඩ මුදල නොගෙවන්නේ නම් මාස 06 ක බ/වැ සහිත සිර දඬුවම් නියම කරමි.

විත්තිට 4 වන චෝදනාවට වසර 07 ක බ/වැ/ සහිත සිර දඬුවම් නියම කරමි. ඊට අමතරව විත්තිට රු.5000/- ක දඩයක් නියම කරමි. එම දඩ මුදල නොගෙවන්නේ නම් මාස 6 ක බ/වැ සහිත සිර දඬුවම් නියම කරමි.

විත්තිට 6 වන චෝදනාවට වසර 07 ක බ/වැ සහිත සිර දඬුවම් නියම කරමි. ඊට අමතරව රු: 5000/- ක දඩයක් නියම කරමි. දඩ මුදල නොගෙවන්නේ නම් මාස 6 ක ~~බ/වැ සහ~~ බ/වැ සහිත සිර දඬුවම් නියම කරමි.

විත්තිට 8 වන චෝදනාවට වසර 7 ක බ/වැ සහිත සිර දඬුවම් නියම කරමි. ඊට අමතරව රු: 5000/- ක දඩයක් නියම කරමි. දඩ මුදල නොගෙවන්නේ නම්, මාස 6 ක බ/වැ සහිත සිර දඬුවම් නියම කරමි.

විත්තිට නියම කර ඇත්තේ, වසර 28 ක සිර දඬුවම්. වසර 7 කට සීමා ගෙවී යන ලෙස [illegible] කරමි.

ඊට අමතරව අ.ලි.ලේ. පනතේ 28 වන වගන්තිය යටතේ වින්දිත ලමයාට ලක්ෂ 5 ක මුදල වන්දියක් වශයෙන් [illegible] නියම කරමි. එම මුදල නොගෙවන්නේ නම් අවුරුදු 01 ක බ/වැ සහිත සිර දඬුවම් නියම කරමි.